| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/2/20/II | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2022.10. 04 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන, මුදල්, ඉංජිනේරු සේවා, සැලසුම්),
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ලේකම්, සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

**<u>ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීමට අදාළව මිනිස් බල තක්සේරුවක් සිදු කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2022.06.22, 2022.09.06, 2022.09.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 14/2022 (I), 14/2022 (II) හා බැඳේ.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම සඳහා වන අයදුම්පත් නිර්දේශ කිරීමේදී, තම ආයතනයෙහි සේවාවන් කාර්යක්ෂමව හා ඵලදායිව පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය සේවක සංඛ්‍යාවක් පවත්වා ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන මෙන් දැනුම් දෙමි.

03. එබැවින්, එම අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩලය නිර්ණය කිරීම සඳහා තනතුරු නාමය (සේවය) අනුව මිනිස් බල තක්සේරුවක් සිදු කළ යුතු අතර එය සකස් කිරීම සඳහා ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය යටතේ පවතින සියලු තනතුරු සැලකිල්ලට ගෙන මේ සමඟ අමුණා ඇති ආකෘතිය ප්‍රකාරව Manpower Assessment Form 01 හි සඳහන් තොරතුරු මා වෙත ඉදිරිපත් කරන මෙන් දන්වමි.

04. තවද, එම ආකෘතිය සම්පූර්ණ කිරීමේදී සැලකිල්ලට ගත යුතු වන්නේ, එක් එක් තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලය නොව, එම තනතුරුවල සේවයේ නියුතු තත්‍ය කාර්ය මණ්ඩලය වේ. එමෙන්ම අන්තර් පළාත් ස්ථාන මාරු සහ මධ්‍යම රජයෙන් ස්ථාන මාරු ලබා දකුණු පළාත් සභාවේ සේවයට නිලධාරීන් පැමිණෙන අවස්ථාවලදී ඒ අනුව උක්ත ආකෘතිය යාවත්කාලීන කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

අ.පි.බ.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

CamScanner

05. එමෙන්ම, විශේෂඥ කුසලතාවයන් සහිත/ තාක්ෂණික දැනුමක් සහිත නිලධාරීන් සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීමේදී, ඔවුන්ගෙන් ඉටුවන සේවය එලෙසින්ම පවත්වාගෙන යා හැකි වන පරිදි කළමනාකරණය කර ගනිමින් නිවාඩු ලබා දිය හැකි නිලධාරීන් ප්‍රමාණය තීරණය කළ යුතු අතර, අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු ගුරුවරුන් සඳහා ඔවුන් උගන්වන විෂයයන් සැලකිල්ලට ගෙන නිවාඩු ලබා දිය හැකි නිලධාරීන් ප්‍රමාණය තීරණය කළ යුතු බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

06. භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/CBP/01/01/04-2022 හා 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව නව බඳවා ගැනීම් සීමා කර ඇති පසුබිමක කිසියම් තනතුරක සේවයේ නියුතු නිලධාරියෙකු රා.ප.ච. 14/2022 අනුව මුදාහැරීමෙන් පසුව ඇතිවන පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට හැකියාවක් නොමැති බැවින්, පසුව නිලධාරියෙකු ලබා ගැනීමේ පදනම මත තීරණ ගැනීමෙන් වැළකිය යුතු බවද දැනුම් දෙමි.

07. තවද, මෙම නිවාඩු අනුමත කරනු ලබන්නේ අවුරුදු 05 ක් වැනි දීර්ඝ කාලයක් සඳහා වන බැවින්, සාමාන්‍ය කෙටි නිවාඩු ලබා ගැනීමේදී ක්‍රියාත්මක කරනු ලබන වැඩ බැලීමට පත් කිරීම ගැටලු සහගත විය හැකි බැවින් ඒ සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කර ගත යුතු බව දැනුම් දෙමි.

08. එමෙන්ම, දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම සඳහා අදාළ අයදුම්පත යොමු කිරීමේදී Manpower Assessment Form 01 අනුව මුදා හැරිය හැකි නිලධාරීන් සංඛ්‍යාව පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර අදාළ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය සඳහා අත්‍යාවශ්‍ය සේවක සංඛ්‍යාව නිර්ණය කිරීම සඳහා තම ආයතන ප්‍රධානීන් හා මාණ්ඩලික නිලධාරීන් සමඟ සාකච්ඡා කොට නිසි තක්සේරුවකට එළඹීම සිදු කළ යුතු බවද දැනුම් දෙමි.

09. ඒ අනුව, උක්ත ආකෘතිය දත්ත පැතුරුම්පත් (MS Excel) භාවිතයෙන් සකස් කර 2022.10.20 දිනට පෙර spvacancies.cs@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ මා වෙත යොමු කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

10. එමෙන්ම, එහි දෘඪ පිටපත කඩිනමින් මා වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටින අතර ඒ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා පහත දුරකථන අංක භාවිතා කරන මෙන් දන්වා සිටිමි.

සදිශානි එල්.යද්දෙහිගේ, සහකාර ප්‍රධාන ලේකම් (පිරිස්) :- 077 725 9626, 071 802 2257

11. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

සුමිත් අලහකෝන්,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**ඇමුණුම 01**

Manpower Assessment Form 01

| තනතුරු නාමය | අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව සංඛ්‍යාව | සත්‍ය කාර්ය මණ්ඩල වාර්තාව අනුව සංඛ්‍යාව (2022.09.30 දිනට) | රා.ප.ච.14/2022 අනුව මේ වන විට නිවාඩු ලබාගෙන ඇති නිලධාරීන් සංඛ්‍යාව | රා.ප.ච.14/2022 අනුව තවදුරටත් වැටුප් රහිත නිවාඩු ලබා දිය හැකි නිලධාරීන් | |
|---|---|---|---|---|---|
| | | | | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| | | | | | |
| | | | | | |
| | | | | | |

සකස් කළේ :- සකස් කල දිනය :-

පරීක්ෂා කළේ :- පරීක්ෂා කළ දිනය :-

අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානී/ ආයතන ප්‍රධානී අත්සන:-

CamScanner